**ලංකා ධීවර සංස්ථාවේ ගනුදෙනු වාර්තාව - 2020 හා 2021**

**------------------------------------------------------------------**

ලංකා ධීවර සංස්ථාවේ 2020 හා 2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා මෙහෙයුම් කටයුතු පිළිබඳ විගණනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ සිදු කරන ලදී. පාර්ලිමේන්තුවට වෙත ඉදිරිපත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණය සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් සහ බැරකම් පිළිබඳ නිසි පොත්පත් සහ වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

එම පනතේ 16(2) උප වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන ආස්ථිතයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සහ වාර්ෂික කාර්ය සාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපති වෙත රීති මඟින් දක්වා ඇති කාල සීමාවන් තුළ ඉදිරිපත් කළ යුතුය.

එම පනතේ 38(1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට සහතික වියයුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආස්ථිතයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගත යුතුය.

**1.3 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6:5:1 උප වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අඩුපාඩු සහිතව 2022 නොවැම්බර් 24 දින විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි. 2019, 2020 සහ 2021 යන වර්ෂයන්ට අදාළ මූල්‍ය ප්‍රකාශන 2022 ඔක්තෝබර් 31 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | එකඟ වේ. මේ වනවිට 2018 වර්ෂයට අදාළ අසම්පූර්ණ ලෙස සඳහන් කර ඇති උපලේඛන ඔබ වෙත ඉදිරිපත් කර ඇත. 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්පූර්ණයෙන් අවසන් වූ පසු අවසන් විගණන වාර්තාවට අනුව 2019 සංශෝධනයන් සිදු කිරීමට පමණක් පවතින බව සඳහන් කරමි. 2020 හා 2021 වර්ෂයන්ට අදාළ මූල්‍ය වාර්තා ද ඉතා ඉක්මනින් අවසන් කිරීමට බලාපොරොත්තු වේ. | චක්‍රලේඛය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

## 1.4 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.4.1 ලැබිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2003 ඔක්තෝම්බර් 07 දිනැති CFC/GM/CIR/51 දරන සංස්ථාවේ අභ්‍යන්තර චක්‍රලේඛය මගින් ණයට අලෙවිය වහාම අත්හිටුවීමට උපදෙස් ලබා දී තිබුණ ද 2021.12.31 දිනට අයවිය යුතු මුළු මසුන් විකුණුම් වටිනාකම රු.261,549,254 ක් වූ අතර මෙයින් වසර 5කට වැඩි බාහිර ණයගැති ශේෂය රු.28,831,013 ක් ද සේවකයින්ට මාළු විකිණීමෙන් වූ නොපියවූ ණයගැති ශේෂය සහ රෝහලේ ණයගැති ශේෂය රු.17,497,325 ක් ද විය. කෙසේ වුව ද චක්‍රලේඛයට පටහැනිව ණයට මසුන් විකුණූ නිලධාරීන්ට එරෙහිව මේ වන විට කිසිදු ක්‍රියාමාර්ගයක් ද ගෙන නොතිබුණි. | ආයතනයේ අලෙවිය වැඩි කිරීම සඳහා බාහිර පාර්ශවයන් වෙත ණය පදනම මත අලෙවි සිදුකර ඇති අතර ආයතනයේ සම්බන්ධ පරීක්ෂණය සිදු කොට අභ්‍යන්තර නිලධාරීන් සම්බන්ධව විනය ක්‍රියාමාර්ග සිදු කොට ඇති අතර අභ්‍යන්තර චක්‍රලේඛ සංශෝධනය කිරීමට කටයුතු කර ඇත. | අභ්‍යන්තර චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියා කළ යුතු අතර එයට අනුගත නොවූ නිලධාරීන් සම්බන්ධව විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | 2020 දෙසැම්බර් 31 දිනට රෝහල් ණයගැතියන් සඳහා ශේෂ සනාථන කැඳවීමේදි රෝහල් 30කින් 16ක පමණක් සනාථන ලැබී තිබුණු අතර එම ලැබූ ශේෂ අතුරින් රු.7,782,214 ක ශේෂ සනාථන සමඟ එකඟ නොවීම් පිළිබඳ පසුවිපරම් සිදුකර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | එකඟ නොවූ ශේෂ සනාථන සඳහා හේතු අනාවරණය කර ගැනීමට පරීක්ෂණ සිදුකළ යුතුය. |

### 1.4.2 ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 ඔක්තෝබර් 31 දිනට ගෙවිය යුතු භාණ්ඩාගාර ඇපකර මතබැංකු ණය ශේෂය රු.158,623,208ක් වන අතර එදිනට ගෙවිය යුතු පොලී මුදල රු.34,531,894ක් හා අංක 1257 දරන බැංකු ගිණුමේ 2021 දෙසැම්බර් 31 දිනට බැංකු ප්‍රකාශය අනුව බැංකු අයිරාව රු.25,491,592ක් වූ අතර සංස්ථාව දිගින් දිගටම පාඩු ලබන බැවින් මෙම අයහපත් මූල්‍ය තත්ත්වය කළමනාකරණය කරගැනීමට නොහැකිව තිබුණි. | අදාළ භාණ්ඩාගාර ඇපකර මත ලබාගෙන ඇති බැංකු ණය ගෙවීම සඳහා ලංකා බැංකුව හා මහා භාණ්ඩාගාරය සමඟ ඉහළ කළමනාකාරිත්වය සාකච්ඡා කොට ඇති අතර අදාළ ක්‍රියාදාමයන් සිදු වෙමින් පවතී. | සංස්ථාවේ අනාගත පැවැත්ම පිළිබඳ අවධානම් සහගත බැවින් කළමණාකරණය ඒ පිළිබඳ දැඩි අවධානය යොමු කළ යුතුය. |

1.5 නීති ,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i)මු.රෙ.103 (ඈ) | නැතිවීම්, හානිවීම් සම්බන්ධව පරීක්ෂණ පවත්වා වගකිව යුත්තන් නිශ්චය කළ යුතු වුවත් ගාල්ල අයිස් යන්ත්‍රාගාරයේ තොග භෞතික සමීක්ෂණයේදී හෙළිදරව් වූ සම්පීඩක යන්ත්‍ර අමතර කොටස් අස්ථානගත වීම සම්බන්ධව පරීක්ෂණ පවත්වා වගකිව යුත්තන් නිශ්චය කිරීම මේ දක්වා කර නොතිබුණු අතර මෙම සම්පීඩක යන්ත්‍රවල වටිනාකම ද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මේ සම්බන්ධව ආයතන මට්ටමින් විධිමත් හා මූල්‍ය පරීක්ෂණයක් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇති අතර අස්ථානගත වූ අමතර කොටස්වලට අදාළව වර්තමාන වෙළඳපොළ වටිනාකමෙහි තක්සේරු වටිනාකම ලබා ගෙන ඇති අතර එම අස්ථානගතවීම සම්බන්ධයෙන් ගාල්ල පොලිස් ස්ථානයේ පැමිණිල්ලක් ද දමා ඇති අතර එයට අදාළ පරීක්ෂණයක් මේ වනවිට පවත්වාගෙන යනු ලබයි. | මෙම පාඩුවට වගකිව යුත්තන් නිශ්චය කිරීම සඳහා පරීක්ෂණ ආරම්භ කළ යුතුය. |
| (ii )මු.රෙ. 175(2) | හිඟ මුදල් ගැන විශේෂ අවධානය යොමු කර, අවශ්‍ය වේ නම් අප්‍රමාදව නීතිප්‍රකාර කටයුතු කිරීමට ආරම්භ කළ යුතු වුවත් 2021 දෙසැම්බර් 31 දිනට මුළු මසුන් අලෙවි හිඟ වටිනාකම වූ රු.261,549,254 න් වසර 01ට අඩු ශේෂය 129,435,004 ක් ද වසර 1-3 ත් අතර ශේෂය රු.42,460,993, වසර 3-5ත් අතර ශේෂය රු.20,743,759ක් සහ වසර 5ට වැඩි ශේෂය රු.68,909,498 ක් වුවත් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | නිෂ්පාදන, අලෙවි, අලෙවි ප්‍රවර්ධන හා ව්‍යාපෘති අංශයට අදාළ හිඟ ණය පිළිබඳ අදාළ ආයතනයන් හා පුද්ගලයන් වෙත ලිපි යොමු කොට ඇති අතර ඉදිරි නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී. තවද සහන වෙළඳසැල සම්බන්ධව ණය ශේෂය සඳහා අදාළ පාර්ශවයන්ට අභ්‍යන්තර පරීක්ෂණ කටයුතු සිදුකර විනය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර මූල්‍ය අපරාධ අංශයේ පැමිණිල්ලක් ද සිදු කර ඇත. | හිඟ මුදල් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 26 වගන්තිය | එකතු කළ අගය මත බදු මුදල් සෑම මසකම 20 වන දිනට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළ යුතු වුවත් 2021දෙසැම්බර් 31දිනට රු.19,696,372 ක මුදලක් ප්‍රේෂණය නොකර රඳවාගෙන පැවතුණි. | ඉදිරියේදී මූල්‍ය තත්ත්වය යහපත් වූ විගස අදාළ ගෙවීම් ඉතා ඉක්මනින් පියවීමට කටයුතු කිරීමට බලාපොරොත්තු වේ. | මෙම බදු මුදල වහාම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළ යුතුය. |
| (ඇ) 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතේ 04 වගන්තිය | ජාතිය ගොඩනැගීමේ බදු මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළයුතු වුවත් 2021දෙසැම්බර් 31දිනට රු.94,316,489 ක මුදලක් රඳවා ගෙන පැවතුණි. | රු.94,316,484.00ක වටිනාකමෙන් 2022 වර්ෂයේදී රු.10,350,626.65ක වටිනාකම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සංස්ථාවට විරුද්ධව කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් ගොනුකරන ලදී. ඒ අනුව 2022.12.12 වන දින ගරු අධිකරණය ඉදිරියේ කැඳවන ලද අවස්ථාවේදී සංස්ථාව මේ වනවිට උග්‍ර මූල්‍ය අර්බුදයක පවතින බවට ගරු අධිකරණය ඉදිරියේ කරුණු දැක්වීමෙන් පසු අදාළ හිඟ මුදල මසකට රු.500,000 බැගින් වාරික වශයෙන් ගෙවා අවසන් කිරීමට නියෝග කරන ලදී. ඒ අනුව පළමු වාරිකය වූ රු.500,000 මුදල 2023.01.25 වන දින ගරු අධිකරණය වෙත ගෙවීම් කටයුතු සිදු කරන ලද අතර ඉතිරිය ඉදිරි වාරික වලින් ගෙවා අවසන් කිරීමට කටයුතු කරන බවත්, අනිකුත් හිඟ බදු මුදල ද මූල්‍ය තත්ත්වය යහපත් වූ වහාම ගෙවා නිම කිරීමට බලාපොරොත්තු වේ. | ජාතිය ගොඩනැගීමේ බදු මුදල් නොපමාව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2015 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත හා 2017 අංක 07 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත | 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ගෙවිය යුතු ආර්ථික සේවා බදු මුදල රු.49,119,889ක් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ ප්‍රේෂණය කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නැත. | ආර්ථික සේවා බදු මුදල් නොපමාව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණ කළ යුතුය. |
| (ඉ) 2013 සැප්තැම්බර් 11 දිනැති අංක 2013/02 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.7 හා 3.9 ඡේදය | චක්‍රලේඛය මගින් හිඟ සේවක අර්ථසාධක දායක මුදල් හා සේවක භාරකාර අරමුදල් දායක මුදල් නිරවුල් කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග හඳුන්වා දී තිබුණ අතර චක්‍රලේඛයේ 3.7 අනුව තවදුරටත් නිරවුල් නොවන හිඟ දායක මුදල් පිළිබඳව අදාළ අමාත්‍යාංශ ලේකම්වරයාට දැනුම් දී භාණ්ඩාගාර ලේකම්ට පිටපතක් ඉදිරිපත් කළ යුතු අතර භාණ්ඩාගාර ලේකම් සමඟ සාකච්ඡා කර විසඳුමකට එළඹීම අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ වගකීමක් විය. එසේම චක්‍රලේඛයේ 3.9 වගන්තිය අනුව තවදුරටත් හිඟ දායක මුදල් වර්ධනය නොවන බවටත් සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලය, ප්‍රධාන විධායක නිලධාරීන් හා විෂයභාර නිලධාරීන් සාමුහිකව හා තනි තනිව වගකීමට බැඳී සිටින බව දක්වා තිබුණි. එසේ වුව ද 2021 දෙසැම්බර් 31 දිනට නිරවුල් නොකරන ලද සේවක අර්ථසාධක අරමුදල සඳහා දායක මුදල් රු.321,171,209ක් ද අධිභාර වශයෙන් රු.165,835, 868ක් ද, සේවක භාරකාර අරමුදල සඳහා දායකය වශයෙන් රු . 15,420,275 ක්ද, අධිභාර වශයෙන් රු.7,710,137 ක් ද විය. | හිඟ දායක මුදල් ගෙවීම් කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශයේ මැදිහත් වීමෙන් කැබිනට් සංදේශයක් හරහා මහා භාණ්ඩාගාරය මගින් යම් ප්‍රතිපාදනයක් ඉල්ලුම් කිරීමටත් එසේ සිදු කිරීමේ දුෂ්කරතාවයක් පවතී නම් වර්තමාන මෙහෙයුම් කටයුතු මත ආයතනය යම් සාධනීය ලාභයක් පෙන්නුම් කිරීම මත මාසිකව ගෙවිය හැකි වාරිකයක් යෝජනා කර ඒ අනුව දිගුකාලීනව මහා භාණ්ඩාගාරයේ ඇපවීම මත බැංකු ණය මුදලක් ලබා ගෙන මෙම දායක මුදල් ගෙවා අවසන් කිරීමට කළමනාකාරිත්වය විසින් තීරණය කර ඇත. | සේවක අර්ථසාධක දායක මුදල් හා සේවක භාරකාර අරමුදල් නිසි පරිදි කලට වේලාවට ප්‍රේෂණය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) 2003 ජුනි 02 දිනැති අංක PED 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3ඡේදය | අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිත යාවත්කාලීන සංයුක්ත සැලැස්මේ පිටපතක් ඊළඟ මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15කට පෙර සංස්ථාව විසින් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුව ද 2021- 2025දක්වා වූ කාල සීමාව සඳහා වන සංයුක්ත සැලැස්ම 2022ජුලි 13 දින එනම් වසර එකහමාරකට පමණ පසු විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. | කෝප් කමිටුව මඟින් ඉදිරිපත් කරන ලද නිර්දේශයන් පදනම් කර ගනිමින් දැනට පිළියෙල කර ඇති පස් අවුරුදු සංයුක්ත සැලැස්ම සංශෝධනය කර නව සංයුක්ත සැලැස්මක් ඉතා කඩිනමින් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරමි. එම සංයුක්ත සැලැස්මේ දිගුවක් ලෙස 2023 වර්ෂයට අදාළ උපායක්‍රමික සැලසුම් අඩංගු සංක්ෂිප්ත ආයතන සැලැස්ම පිළියෙල කර අදාළ ආයතන වෙත දැනටමත් ඉදිරිපත් කර ඇත. | අධ්‍යක්ෂ මණ්ලයේ අනුමැතිය සහිත යාවත්කාලීන සංයුක්ත සැලැස්මේ පිටපතක් ඊළඟ මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15කට පෙර සංස්ථාව විසින් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

## 2. මෙහෙයුම් සමාලෝචනය

### 2.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ධීවර සංස්ථාවට අයත් රු.1,273,400,000 ක් වටිනා ඉඩම් අක්කර 46 රූඩ් 01 පර්චස් 10ක් 2021 දෙසැම්බර් 31 දින විට විටත් සංස්ථාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | සංස්ථාවට අයත් ඉඩම් සංස්ථාවට පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) මීගමුව, ත්‍රිකුණාමලය, බේරුවල, මිරිස්ස, පුරාණවැල්ල, කුඩාවැල්ල, තංගල්ල, පැලියගොඩ, මාතර, බෙලිඅත්ත, වීරකැටිය, අම්බලන්ගොඩ, අඟුණකොළපැලැස්ස යන ප්‍රදේශවල සංස්ථාව විසින් භාවිතා කරනු ලබන ඉඩම් 15ක් සම්බන්ධයෙන් එම ඉඩම් වල ප්‍රමාණය, වටිනාකම, අයිතිය, පවරා ගැනීම සහ තක්සේරුව යන කිසිඳු තොරතුරක් සංස්ථාව සතු නොවීය. | පිළිතුරු ලබා දී නොමැත. | ඉඩම් සම්බන්ධයෙන් වූ සියලු තොරතුරු සංස්ථාව විසින් පවත්වා ගත යුතුය. |

## 2.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 ජුලි 22 ගාල්ල අයිස් යන්ත්‍රාගාරය බදු දීම සඳහා විධායකය, පෞද්ගලික ආයතනයක් සමඟ එළඹි ගිවිසුම ප්‍රකාරව සංස්ථාවේ භුක්තියේ පවතින සම්පීඩක යන්ත්‍ර නඩත්තුව හා අලුත්වැඩියාව පිළිබඳව කිසිදු වගන්තියක් ඇතුළත් නොවුනු අතර සංස්ථාවේ පූර්ව අනුමැතියකින් තොරව බදු ගැණුම්කාර පාර්ශවය විසින් සම්පීඩක යන්ත්‍ර 02ක අලුත්වැඩියාව සඳහා වෙනත් පෞද්ගලික සමාගමකට භාරදී තිබුණ ද රු.මිලියන 7.1 ක (ඇ.ඩො 10,000 ක) වෙළඳපොළ වටිනාකමක් පවතින සම්පීඩක යන්ත්‍ර 2022 නොවැම්බර් 30 වන විටත් අකර්මණ්‍ය තත්ත්වයේ පැවතුණි. | පිළිතුරු ලබා දී නොමැත. | සම්පීඩක යන්ත්‍ර අලුත්වැඩියාකර භාවිතයට ගත යුතුය. |
| (ආ) | සංස්ථාව මඟින් රෝහල් සඳහා මසුන් හා කරවල නිකුත් කරනු ලබන්නේ රෝහල් මඟින් ඉල්ලුම් කරන මසුන් / කරවල වර්ගය හා ප්‍රමාණය සඳහා වුව ද 2020 වර්ෂයේ මාස 04 හා 2021 වර්ෂයේ මාස 08කට අදාළ දෛනික ආපසු එවුම් පොත (Return Day Book) පරීක්ෂාවේදී රෝහල් 10 කින් රු.573,653 ක් වටිනා මසුන්/කරවල කිලෝ 676.3 ක ප්‍රමාණයක් හරවා එවා තිබුණු අතර, මේ පිළිබඳව සොයා බැලීමට සංස්ථාවේ රෝහල් සැපයුම් අංශයෙන් පියවර ගෙන නොතිබුණි. මීට අමතරව රාජ්‍ය සේවා සැපයුම් අංශය මඟින් සහන මිලට මත්සය හා කරවල තොග සපයනු ලබන්නේ රෝහල් අවශ්‍යතාවයට පමණක් විය යුතු නමුත් එම සහන මිලටම රෝහල් කාර්ය මණ්ඩලය සඳහා ද මසුන් ලබා දී තිබුණු අවස්ථා 11ක දී රු. 282,318ක් වටිනා මසුන්/කරවල කිලෝ 315 ක් ආපසු එවා තිබුණු බව නිරීක්ෂණය විය. රෝහල් වෙත සහන මිලට ලබා දෙන මසුන් ප්‍රවාහන සඳහා පිරිවැය ද සංස්ථාව විසින් දරා ගනිමින් සැපයුම් කර තිබුණු අතර, සංස්ථාව දිගින් දිගටම පාඩු ලැබීම කෙරෙහි එම කරුණු ද බලපා ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. | කොවිඩ් අර්බුදකාරී තත්ත්වයන්ට අනුව ආයතනයේ සේවක පැමිණීම ඉතා සීමිත වූ අතර අංශයේ දෛනික මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යන ලද්දේ ඉතා අසීරුවෙනි. ඒ හේතුවෙන් රෝහල් සැපයීම් කටයුතු ප්‍රමාද වූ බැවින් රෝහල් විසින් මසුන් හා කරවල භාර නොගෙන ආපසු එවා තිබූ අතර එම ආපසු එවන ලද මසුන් නැවතත් රෝහල් ඇණවුම් සඳහාම සපයා ඇත. කොවිඩ් වසංගතය හේතුවෙන් රෝහල් කාර්ය මණ්ඩලයට ආහාර ද්‍රව්‍ය වෙළඳපොලින් සපයා ගැනීමේ අපහසුතාවය දන්වමින් කරන ලද ඉල්ලීමකට අනුව සානුකම්පිත හේතූන් මත රෝහල් කාර්ය මණ්ඩලය වෙත ඉතා අවම ප්‍රමාණයක් මසුන් /කරවල රෝහල් සහන | මසුන්/කරවල ආපසු හරවා නොඑවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කළමණාකරණය වග බලා ගත යුතු අතර රෝහල් අවශ්‍යතාවයට පමණක් මසුන්/කරවල නිකුත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | මිලටම සපයා ඇති නමුත් එලෙස සපයන ලද මසුන් / කරවල ආපසු එවා නොමැත. එම රෝහල් කාර්ය මණ්ඩලය වෙත සපයා ඇති මසුන් කරවල එම රෝහලට අදාළ රෝහල් ඇණවුම සමහම සැපයීම සිදුකර ඇති නිසා මසුන් ප්‍රවාහනය සඳහා අමතර පිරිවැයක් දැරීමට සිදුවී නොමැති අතර ආයතනය පාඩු ලැබීම කෙරෙහි එම කරුණ බලපා නොමැත. | |
| (ඇ) | 2018, 2019 හා 2020 වර්ෂයන්වලදී රු.2,093,548ක මූලික වියදමක් දරා ඉදිකරන ලද වෙළෙඳසැල් 8ක් 2020 වර්ෂයේදී වසා දමා තිබුණු අතර මේ තුළ 2020 වර්ෂයේදී ආරම්භකර ලද වෙළෙඳසැල් 03ක් ද විය. 2021 වර්ෂය තුළදී රු.1,461,658ක මූලික පිරිවැයක් දරා ඉදිකරන ලද මේ තුළ 2020 වර්ෂයේදී ආරම්භ කළ වෙළෙඳසැල් 04ක් හා 2021 වර්ෂයේ ආරම්භ කරන ලද එක් වෙළෙඳසැලක් ද විය. වෙළඳසැලක් ආරම්භ කිරීමට පෙර අදාළ ප්‍රදේශයේ වෙළඳසැලක් ආරම්භකර ප්‍රමාණවත් අලෙවියක් සිදු කළ හැකි දැයි යන්න පිළිබඳව වෙළෙඳපොළ සමීක්ෂණයක් සිදු නොකිරීම නිසා මෙලෙස වෙළඳසැල් වසා දැමීමට සිදු වන බවද මෙසේ වසා දැමීම නිසා දරන ලද වියදම් නිෂ්කාර්ය වීම හේතුකොට ගෙන සංස්ථාව දිගින් දිගටම අලාභ ලබන තත්ත්වයකට පත්වන බව ද විගණනයට නිරීක්ෂණය විය. | නව වෙළඳසැලක් ආරම්භ කිරීම සඳහා සුදුසු ස්ථානයක් තෝරා ගැනීමේදී මහජනතාව වැඩි වශයෙන් ගැවසෙන ප්‍රධාන නගරයන් කේන්ද්‍ර කර ගැනීම දැනට සංස්ථාව විසින් අනුගමනය කරන සාමාන්‍ය ක්‍රමවේදය වේ. ඒ අනුව බොහෝ අවස්ථාවලදී අපේක්ෂිත අලෙවිය ළඟා කර ගත හැකි වුවත් ඇතැම් අවස්ථාවලදී පවතින තරඟකාරී වෙළඳපොළ තුළ වෙළඳසැලේ අපේක්ෂිත අලෙවිය ලබා ගැනීමට නොහැකි වී යයි.<br>ඒ සඳහා බාහිර වෙළඳසැල් වල පවතින තරඟකාරිත්වය මෙන්ම වෙළඳසැලේ සේවය කරන සේවක මහතුන්ගේ දුර්වලතා යන කරුණු බලපානු ලබන අතර යම් කරුණක් හේතුවෙන් එක් වරක් පාරිභෝගිකයා වෙතින් | නව වෙළඳසැලක් ආරම්භ කිරීම සඳහා සුදුසු ස්ථානයක් තෝරා ගැනීමේදී වෙළෙඳපොළ සමීක්ෂණයක් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ප්‍රතික්ෂේප වුවහොත් පවතින තරඟකාරී වෙළඳපොළ තුළ නැවත එම පාරිභෝගිකයා වෙළඳසැල වෙත කැඳවා ගැනීම අපහසු වේ. ඒ අනුව අලුතින් ආරම්භ කරන බොහෝ වෙළඳසැල් මගින් සාර්ථක අලෙවියක් ලබා ගත හැකි වුවත් ඇතැම් වෙළඳසැල් අසාර්ථක තත්ත්වයට පත්වේ. | |

## 2.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31දිනට ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ (HM) සාමාන්‍යාධිකාරි, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අලෙවි), නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ඉංජිනේරු) යන තනතුරු 3 සඳහා පුරප්පාඩු පැවති අතර 2021දෙසැම්බර් 31 දිනට එම ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 3 සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මානව සම්පත් සංවර්ධන හා පරිපාලන) ඇතුළුව තනතුරු 04ක් පුරප්පාඩුව පැවතුණි. ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ දීර්ඝකාලීනව පවතින මෙම පුරප්පාඩු තනතුරු පිරවීම සඳහා සංස්ථා කළමනාකාරීත්වය 2022 නොවැම්බර් 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | 2022.12.31 දිනට ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 03ක් හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පරිපාලන) ඇතුළු තනතුරු 04ක් සඳහා මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද BD/CBP/01/01/04-2022 හා 2022.04.16 දිනැති චක්‍රලේඛ ප්‍රකාරව බඳවා ගැනීම් අත්හිටුවා ඇති බැවින් ඉහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට ධීවර අමාත්‍යාංශය මගින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත 2022.11.04 දින අනුමැතිය සඳහා ලිපි යොමු කර ඇත. | ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ දීර්ඝකාලීනව පවතින පුරප්පාඩු කඩිනමින් පිරවීම සඳහා ක්‍රියා කළ යුතුය. |
| (ආ) | 2020 දෙසැම්බර් 31දිනට කළමනාකරණ මට්ටමේ (MM) තනතුරු 11ක් සඳහා පුරප්පාඩු 20ක් පැවති අතර 2021 දෙසැම්බර් 31දිනට කළමනාකරණ මට්ටමේ තනතුරු 11ක් සඳහා පුරප්පාඩු 23ක් පැවතුණි . එම තනතුරු වලින් තනතුරු 4ක් පමණක් වැඩ බැලීමේ නිලධාරීන් යොදවාගෙන කාර්යයන් සිදුකර ඇති බව නිරීක්ෂණය විය .මෙම තත්ත්වය සංස්ථාවේ කාර්යසාධනයට දැඩි බලපෑමක් බව විගණනයට නිරීක්ෂණය විය . | 2020.12.31 දිනට කළමනාකරණ (MM1.1) ශ්‍රේණියට අයත් පුරප්පාඩු තනතුරු විස්තරය අනුව පරිපාලන කළමනාකාර, කළමනාකාර අලෙවි යන තනතුරු සඳහා නිලධාරීන් පත්කර ඇත. සත්‍ය වශයෙන් පුරප්පාඩු පවතින තනතුරු සඳහා විධිමත් ක්‍රමවේදයන් අනුගමනය කරමින් වැඩ බලන තනතුරු පිහිටුවීමට හෝ නව බඳවා ගැනීමට අදාළ කටයුතු සිදුකරමින් පවතී.<br>බඳවා ගැනීම් පටිපාටිය සංස්ථාවට අදාළ කර ගැනීම සම්බන්ධයෙන් | පුරප්පාඩු තනතුරු කඩිනමින් පිරවීම සඳහා ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් අමාත්‍යාංශය විසින් නම්කර පුරප්පාඩු තනතුරු සඳහා අභ්‍යන්තරින් අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණයන් පවත්වා තනතුරු ලබා දීමට අදාල ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතය. | |
| (ඇ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක DMS / 16 / 18 දරන 2018 ජුලි 16 දිනැති ලිපියේ 04වන වගන්තිය අනුව ආයතනයේ මූල්‍ය තත්ත්වයට සහ ක්‍රියාකාරීත්වයට බලපාන ලෙස අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා කිසිදු බඳවාගැනීමක් සිදු නොකළ යුතු වුවත් සංස්ථාව විසින් අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා 2020දෙසැම්බර් 31දිනට තනතුරු 8ක් සඳහා නිලධාරීන් හා සේවකයන් 99 කුත් 2021දෙසැම්බර් 31තනතුරු 6ක් සඳහා නිලධාරීන් හා සේවකයන් 78ක් බඳවාගෙන තිබුණි. | සංස්ථාව විසින් නව බඳවා ගැනීම් සිදුකර නොමැති අතර 2019 වර්ෂයේ දින 180 සම්පූර්ණ කරන ලද සේවකයන් චක්‍රලේඛ ප්‍රකාරව ස්ථිර කරන ලදී. බඳවා ගැනීම් පටිපාටිය අනුව සේවකයින් අන්තර්ග්‍රහනය කිරීමක් සිදුකර නොමැත. බඳවා ගැනීම් පටිපාටිය සංස්ථාවට අදාළ කර ගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරමින් පවතී. | අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා කිසිදු බඳවාගැනීමක් සිදු නොකළ යුතුය. |
| (ඈ) | ලංකා ධීවර සංස්ථාවේ තනතුරු 09ක් සඳහා වැඩ බැලීම් සිදුකරනු ලබන අතර එම වැඩ බැලීම් අවුරුදු 01සිට අවුරුදු 05ක් දක්වා සිදුකරනු ලබන බවත් පත්වීම් සිදුකිරීමට වසර 5ක් දක්වාම කළමනාකරණය විසින් කටයුතු කර නොතිබුණු බවත් ඒ වෙනුවෙන් රු 4,690,932.ක් ගෙවා තිබුණු බවත් නිරීක්ෂණය විය . | වැඩ බැලීම් තනතුරු සිදු කරනු ලබන නිලධාරී සඳහා තනතුරු පිහිටුවීම සම්බන්ධයෙන් විධිමත් පරිදි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් අමාත්‍යාංශ නියෝජිතයන්ගෙන් පත්කර ඇති අතර කඩිනමින් එම තනතුරු ලබා දීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලබයි. | වැඩ බැලීම් තනතුරු සඳහා කඩිනමින් ස්ථිර ලෙස සේවකයින් බඳවා ගැනිමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2019 අගෝස්තු 22දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කරන අවස්ථාවේ ව්‍යාපාරික සැලැස්ම පිළියෙල කර නොතිබු බැවින් අදාළ අංශ හා විධායකයන් වෙත කොපමණ සේවක සංඛ්‍යාවක් අදාළ කරගත යුතු ද යන්න අනුමත කර නොතිබුණි. මේ අනුව විවිධ අංශ හා විධායක 21 ක් සඳහා සේවකයින් 430දෙනෙකු කිසිදු පදනමක් නොමැතිව අනුයුක්ත කර තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | විවිධ අංශ සහ විධායකයන් සඳහා අනුයුක්ත කළ යුතු සේවක සංඛ්‍යාව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරගත යුතුය. |

## 2.4 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 20 දින රු.587,520 ක ආසන්න වටිනාකමක් සහිත මත්ස්‍ය තොග භාවිතයට නුසුදුසු තත්ත්වයට පත් වී කසල ලෙස ඉවත් කිරීම නිසා සංස්ථාවට මූල්‍ය පාඩුවක් සිදු වී තිබුණු අතර ඒ පිළිබඳ කිසිදු පසුවිපරමක් සිදුකර වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | සංස්ථාවට මූල්‍ය පාඩු සිදු නොවන පරිදි කළමනාකරණය කටයුතු කළ යුතුය. |
| (ආ) | විකුණුම් හරවා එවුම් පිළිබඳව හෝ එලෙස හරවා එවුම්වල උපරිමය පිළිබඳවත්, හරවා එවීමට හේතු වූ වැරදි සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන හරවා එවුම් අවම කිරීම සඳහා කළමනාකරණය විසින් කිසිදු අභ්‍යන්තර චක්‍රලේඛයක් නිකුත් කර නොතිබුණි. ගාල්ල විධායකයේ 2020 වර්ෂයේ රු.14,635,446 ක් වටිනා මත්ස්‍ය කිලෝ 19,492 ක් විකිණීමෙන් පසු හරවා එවුම් ලෙස භාරගෙන තිබුණ ද මෙයට බලපෑ හේතු පිළිබඳ කළමනාකරණය විසින් පසු විපරම් කටයුතු සිදු කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | විකුණුම් හරවා එවුම් පිළිබඳ අභ්‍යන්තර චක්‍රලේඛ උපදෙස් කළමනාකරණය විසින් නිකුත්කර හරවා එවුම් අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | 2021 වර්ෂය සඳහා ක්‍රියාකාරකම් 14 ක් සැලසුම්කර තිබුණ ද පහත ක්‍රියාකාරකම් 9 ක්‍රියාත්මක කර නොතිබුණි. | | |
| (i) | මෝදර ප්‍රධාන කාර්යාලයේ සූර්ය බලශක්ති ඒකකයක් සමඟ ශීතාගාර සංකීර්ණයක් ස්ථාපිත කිරීම. | 2021 ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම සඳහා ප්‍රධාන වශයෙන්ම ප්‍රතිපාදනයන් පාදක කරගනු ලැබුයේ ජාතික අයවැය ලේඛණය මඟින් ලංකා ධීවර | |
| (ii) | සුපිරි අලෙවිසැල් 20 ක් ස්ථාපිත කිරීම | | |

| | | |
|---|---|---|
| (iii) ව්‍යාපාර සම්පත් සැලසුම්කරණ පද්ධතියක් හඳුන්වා දීම.<br>(iv) වරාය පරිශ්‍රයන් තුළ අධිශීතකරණ බහාලුම් ස්ථාපිත කිරීම.<br>(v) අනුරාධපුර අයිස් යන්ත්‍රාගාරය අලුත්වැඩියා කිරීම.<br>(vi) ෆෝක්ලිෆ්ට් යන්ත්‍ර 2ක් මිලදී ගැනීම.<br>(vii) මින්නේරියේ අලුත් අයිස් යන්ත්‍රාගාරයක් ස්ථාපිත කිරීම.<br>(viii) උතුරු පළාතේ නව ශීතාගාර සංකීර්ණයක් ස්ථාපිත කිරීම.<br>(ix) මෝදර මාළු සැකසුම් ඒකකයක් ස්ථාපිත කිරීම. | සංස්ථාව වෙත ප්‍රතිව්‍යුහගත කිරිම හා මෙහෙයුම් ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා රු.මිලියන 500ක මුදල් ප්‍රතිපාදනයක් ලෙසය. එනමුත් ජාතික අයවැය ලේඛනය මඟින් වෙන් කරන ලද මුදලින් කිසිදු මුදලක් එම වර්ෂය තුළ නොලද අතර ප්‍රධාන මූල්‍ය ප්‍රවාහය වන මසුන් අලෙවිය මත ලද මුදල් මඟින් සෘජු අලෙවි වර්ධනය කිරීමට අදාලව යම් ප්‍රමාණයක නව වෙළඳසැල් ආරම්භ කිරීම හැර අනිකුත් කාර්යයන් සිදු කිරීමට නොහැකි විය. | ක්‍රියාකාරී සැලැසුම් වලට අනුව ප්‍රගතිය ලබාගත යුතුය |

### 3.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31දිනට හලාවත විධායකයේ සේවය කරන ලද සේවකයකුට විරුද්ධව රු.1,594,067 ක මුදලක් වංචා කිරීම හා පැලියගොඩ මත්ස්‍ය වෙළෙඳපොලේ මෙට්‍රෝ විධායකයේ සේවකයකුට විරුද්ධව රු.619,815 ක මසුන් මුදල් වංචා කිරීම සම්බන්ධව සංස්ථාව විසින් එම පුද්ගලයන්ට විරුද්ධව නඩු පවරා තිබුණු අතර ,සේවකයන්ට මෙලෙස සංස්ථාව සතු මුදල් වංචා කිරීමට නොහැකි වන පරිදි අභ්‍යන්තර විගණනයක් සංස්ථාව විසින් ක්‍රියාත්මක කර නොමැති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය . | විගණන විමසුම මඟින් සඳහන් කර ඇති මෙම ණය ශේෂ ඇතිවීම හා අයකර ගැනීම සම්බන්ධයෙන් පැරණි ක්‍රමවේදයන්හි දුර්වලතාවයන් පවතින බව පිළිගන්නා අතර වර්තමානයේදී ඉහළ කළමනාකාරිත්වය මඟින් සෘජු අධීක්ෂණය යටතේ ණය එකතු කිරීම් අංශය ශක්තිමක් කර සතිපතා එහි ප්‍රගතිය නියාමනය කරනු ලබන අතර මූලික ප්‍රසම්පාදන කටයුතු අවසන් කර ඇති පරිඝණක ගිණුම්කරණ පද්ධතිය ඉතා කඩිනමින් ස්ථාපිත කිරීම මත මෙම දුර්වතාවය සම්බන්ධයෙන් සාධනීය වූ ප්‍රගතියක් ලබා ගත හැකි බව සඳහන් කරමි. | ශක්තිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් හා පාලන ක්‍රමවේදයක් සකස්කර කර වංචා හා වැරදි අවම කර ගැනිමට කළමනාකරණය ක්‍රියා කළ යුතුය. |